අලෙවිකරණය

# නොවිසඳිය හැකි අලෙවි ගැටළුවට පොල්පලා අභියෝගය

මෙම තත්ත්වය මත ලංකාවේ ගොවීන් සාම්ප්‍රදායික කෘෂි නිෂ්පාදනවලට වහල්වී නොසිට එම නිෂ්පාදනවලට හොඳමිලක් හෝ වෙළඳපොලක් නොමැති නම් විකල්පයක් ලෙස පොල්පලා වගා කළ හැකිය. ඒ අතරම අද වියළි කලාපයේ ජලය නොමැතිව වගාකළ නොහැකි ඉඩම් විශාල ප්‍රමාණයක් කිසිදු ප්‍රයෝජනයකට නොගෙන අතහැර දමා ඇත. මෙම සියළු ඉඩම් පොල්පලා වගාවට යෝග්‍ය විය හැකිය. මේ පිළිබඳ ගොවීන් විසින් තවදුරටත් උනන්දු විය යුතුයි.

**අලෙවි හා ආහාර ප්‍රතිපත්ති අංශයේ සංඛ්‍යාණ නිලධාරිණි. සන්ධ්‍යා සේනානායක විසිනි.**

ශ්‍රී ලංකාවේ ජනගහණයෙන් වැඩි කොටසක් කෘෂිකර්මය හා ඒ ආශ්‍රිත කටයුතුවලින් ලබන ආදායමින් ජීවත් වන අතර කෘෂිකර්මාන්ත ක්ෂේත්‍රය සමස්ථ ආර්ථික ව්‍යුහයේ දළ දේශීය නිෂ්පාදිතයට කරනු ලබන දායකත්වය 20%ක් පමණ වේ. මුළු සේවා නියුක්ති ප්‍රමාණයෙන් 40%ක් පමණ රැකියා කරනු ලබන්නේ කෘෂිකාර්මික ක්ෂේත්‍රයේය. අප ආර්ථිකයේ ප්‍රධාන අංශයක් වන කෘෂිකර්මාන්තය කෙරෙහි ප්‍රමාණවත් සැලකිල්ලක් නොදැක්වීමත්, කෘෂිකර්මාන්තයෙන් යැපෙන ගොවීන්ගේ ජීවන තත්ත්වය වැඩිදියුණු කිරීමට උපකාරී වන ප්‍රතිපත්තීන් කෙරෙහි ප්‍රමාණවත් අවධානයක් යොමු නොවීමත් හේතු කොට ගෙන පසුගිය කාල වකවානුවේදී කෘෂිකාර්මික කටයුතුවල නියැලෙන ගොවීන්ට ගැටළු රාශියකට මුහුණදීමට සිදුවී ඇත.

මේ ගැටළු අතුරින් අප රටේ කෘෂිකර්මාන්තයේ නියැලෙන ගොවීන්ගෙන් නිරන්තරයෙන්ම ඉදිරිපත් කෙරෙන ප්‍රධාන ගැටළුව වන්නේ ඔවුන්ට තම නිෂ්පාදන වලට ප්‍රමාණවත් මිලක් නොලැබීමයි. මෙම අවම ගොවිපොල මිල මත එම භාණ්ඩවලට ඉතා ඉහළ මිලක් අවසාන පාරිභෝගිකයාට ගෙවීමට සිදුවීම අලෙවිකරන ක්‍රියාවලියේ දක්නට ලැබෙන අකාර්යක්ෂමතාවයකි. විවෘත ආර්ථික ක්‍රමය යටතේ පෞද්ගලික අංශයේ විශාල කාර්යභාරයක් ඉටු කරනු ලබන හෙයින් ඒ නිසාම මේ තත්ත්වය තවදුරටත් උත්සන්නවී ඇත..

මෙම අලෙවිකරණ ගැටළුව පැනනැගී ඇති ආකාරය එසේ වුවත් මෙහි ප්‍රායෝගික ක්‍රියාකාරිත්වය ගත් කළ ප්‍රධාන වශයෙන්ම මෙය බලපානු ලබන්නේ සුළු ගොවීන්ටයි. දහසකුත් එකක් ප්‍රශ්ණ මැද්දේ ජීවන අරගලය ගෙනයාම සඳහාම කරනු ලැබූ කුමන හෝ කෘෂි නිෂ්පාදන අලෙවි කර ලබා ගන්නා ආදායම තම වියදම් වලටවත් ප්‍රමාණවත් නොවීමේ ප්‍රශ්නයට ඔවුහු මුහුණ පා සිටිති මෙම සුළු ආදායමින් ඔවුන්ගේ පවුල්වල විවිධ වියදම්, ණය පියවීම් හා එදිනෙදා ජීවත්වීම යනාදී සියල්ල කර ගත යුතුව ඇත. නමුත් ඔවුන් ලබන ආදායම අපේක්ෂිත ආදායමට වඩා අඩුවූ විට මෙම කාර්යයන් සියල්ල කර ගත නොහැකිවේ. එහි අවසන් ප්‍රතිඵලය වන්නේ තවදුරටත් ණයවීම නැත්නම් සියදිවි නසා ගැනීමයි. මේ විකල්ප දෙකම අද ගොවීන්ට ඉතාමත් හුරුපුරුදුය. හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය පුත්තලම දිස්ත්‍රික්කයේ කරන ලද ක්‍රියාකාරී පර්යේෂණයක තොරතුරු අනුව ඉහතකී කෘෂි අලෙවි ප්‍රශ්ණයෙන් කාලයක් තිස්සේ බැටකෑ ගොවීන් ඒ වෙනුවට වෙනත් විකල්පයක් කෙරෙහි යොමුවී ඇත..

එනම් ඕනෑම කටුක දේශගුණයකට ඔරොත්තු දෙන ඖෂධීය ගුණයෙන් පිරිපුන් පොල්පලා වගා කිරීමයි. කලක් තිස්සේ ගොවීන් හුරුපුරුදුවී තිබුනේ නිදැල්ලේ වන ලැහැබ්වල සරුවට වැඩුන පොල්පලා එක්රැස් කර කීයකට හරි විකුණා ආදායමක් ලබා ගැනීමයි. පොල්පලා හොඳින් වියලා ඒ ඒ ප්‍රදේශවල පොල්පලා වගා කිරීමට හෝ සාත්තු කිරීමට කිසි වියදමක් නොයන බැවින් ලැබෙන කුඩා මුදල වුවත් ගොවීන්ට එය සැලකිය යුතු ආදායමකි. පොල්පලා කිලෝවක් සඳහා අතරමැදි වෙළෙන්දන් ගොවීන්ට ගෙවා ඇත්තේ

කිලෝ එකකට රු.8ත් 10ත් අතර මිලකි. ගොවීන්ගේ දරිද්‍රතාවය හමුවේ මේ මිලද සැලකිය යුතු මිලක් ලෙස ඔවුන් පිළිගෙන තිබුනි. මෙම ප්‍රදේශවල බොහෝ ගොවීන්ට ඉඩම් තිබුණත් වගාවට ප්‍රමාණවත් ජලය ලබා ගැනීමට හැකියාවක් තිබුනේ නැත. එමනිසා ගොවීන් පුරුදුවී සිටියේ වැසි සමයට කවුපර බෝග වගා කිරීමටය. නමුත් එයින්ද අපේක්ෂිත ආදායමක් ඔවුන්ට ලැබුනේ නැත.

මේ අතර ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයෙන් කරන ලද කෘෂි ද්‍රව්‍ය අලෙවිකරණ ක්‍රියාකාරී ව්‍යාපෘතිය යටතේ පොල්පලා වලට ගොවීන් ලහටම ගොස් රු. 20- 30ක් අතර මිලකට පොල්පලා කිලෝවකට ගෙවීමට කැමති පෞද්ගලික ආයතන සම්බන්ධවීම නිසා ගොවීන්ගේ ආදායම එකවරම දෙගුණයක් කර ගත හැකි විය. එමෙන්ම ඕනෑම කටුක දේශගුණයකට ඔරොත්තු දෙන බැවින් පොල්පලා ගස ඕනෑම පරිසරයක වගා කල හැකිය. මෙසේ පොල්පලාවලට හොඳ මිලක් හා වෙළඳපොලක් තිබෙන බැවින් විශාල වශයෙන් පොල්පලා දිගින් දිගටම රැස් කිරීම නිසා පොල්පලා ක්‍රමයෙන් අඩුවෙමින් යන බව ගොවීන් තේරුම් ගෙන ඇත. එමෙන්ම ස්ථිර මිලක් හා හොඳ වෙළඳපොලක් තිබෙන බවද ඔවුන් අවබෝධ කර ගෙන ඇති බැවින් සමහර ප්‍රදේශවල ගොවීන් අද පොල්පලා වගා කිරීම සඳහා පෙලඹී ඇත. මෙම පොල්පලා වගා කිරීමට කැමති ගොවීන්ට අවශ්‍ය බීජ හා උපදෙස් පවා ලබාදීමට පෞද්ගලික ආයතන ඉදිරිපත් වී ඇත. එමෙන්ම වගා කරන සියළුම පොල්පලා ගොවි පොලේදීම මිලදී ගැනීමටද ඔවුන් පොරොන්දුවී ඇත. මෙම තත්ත්වය මත කෘෂි අලෙවි ගැටළුවට විසඳුමක් ලෙස අඛණ්ඩ වෙළඳපොලක් හා හොඳ මිලක් ඇති පොල්පලා වගාව සඳහා ගොවීන් නිතැතින්ම යොමුවී ඇත. මෙවන් ගොවිපොලවල් ගණනාවක් පුත්තලම දිස්ත්‍රික්කයේ තැනින් තැන දැකිය හැකිය.

මෙම පොල්පලා වගා කරන ගොවි මහතෙකු සමඟ කථා කළ විට කියා සිටියේ මෙම ප්‍රදේශයේ වගා කළ හැකි කිසිදු වගාවකින් ලබා ගත නොහැකි ආදායමක් පොල්පලාවෙන් ලබා ගත හැකි බවයි. පොල්පලා වගාව සඳහා විශේෂ වියදමක් දැරීමට සිදුවන්නේ නැත. රසායනික බෙහෙත්, පොහොර හෝ ජලය සැපයීම අවශ්‍ය නැත. පොල්පලා පැල සිටුවා මාස 3ක් 3 1/2ක් අතර කාලයක් තුල අස්වනු ලබා ගත හැකි වන අතර එකම වගාවකින් වසරකට තුන්වරක් අස්වනු ලබා ගත හැකිය. පොල්පලා පැල සිටුවා පලමු මාස 3 1/2ක් ගිය කළ පොල්පලා මුල පිටින් ගලවන්නේ නැතිව ගොයම් කපන්නාක් මෙන් කපා ගතහැකිය. ඉන්පසු නැවත එම මුල් ලියලන අතර තවත් මාස 3කින් පමණ නැවත කපා ගත හැකිය. ඊලඟ වතාවේදී පොල්පලා ගස මුලින්ම උදුරා ගත යුතුය. ඒ වන විට එම භූමියේ පොල්පලා නැවත සිටුවීමට අවශ්‍ය නොවන අතර පොල්පලා ඇට බිම වැටී නැවත පැලවෙයි. මෙම පැලවලින් වැඩි පැල වෙනත් ඉඩම්වල වගා කිරීම සඳහා යොදා ගත හැකි. සාමාන්‍යයෙන් පොල්පලා පැල සිටුවනු ලබන්නේ අඩි 1 x 1 පරතරයටය. මේ සඳහා කෘෂිකර්ම ව්‍යාප්ති සේවාවක් හෝ කිසිදු උපදේශක සේවාවක් තවම හඳුන්වාදී නොමැති අතර ඉදිරියේදී ආර්ථික වගාවක් ලෙස පොල්පලා වගාවට ද ව්‍යාප්ති සේවාවක් බිහිවිය හැකිය. පෞද්ගලික අංශයේ පොල්පලා වලට විදේශ වෙළඳපොලේ විශාල ඉල්ලුමක් පවතී.. දැනටමත් රුසියාව අපේ පොල්පලා සැලකිය යුතු ප්‍රමාණයක් මිලදී ගනු ලබයි. පොල්පලා වලට ඇති ඉල්ලුමට සාපේක්ෂව ප්‍රමාණවත් සැපයුමක් ලංකාවේ නොමැති බවත්, එම නිසාම ඉදිරියේදී හොඳ මිලක් හා වෙළඳපොළක් පොල්පලාවලට ලැබෙන බවත් ඔවුන්ගේ මතයයි.

මෙම තත්ත්වය මත ලංකාවේ ගොවීන් සාම්ප්‍රදායික කෘෂි නිෂ්පාදනවලට වහල්වී නොසිට එම නිෂ්පාදනවලට හොඳමිලක් හෝ වෙළඳපොලක් නොමැති නම් විකල්පයක් ලෙස පොල්පලා වගා කළ හැකිය. ඒ අතරම අද වියළි කලාපයේ ජලය නොමැතිව වගාකළ නොහැකි ඉඩම් විශාල ප්‍රමාණයක් කිසිදු ප්‍රයෝජනයකට නොගෙන අතහැර දමා ඇත. මෙම සියළු ඉඩම් පොල්පලා වගාවට යෝග්‍ය විය හැකිය. මේ පිළිබඳ ගොවීන් විසින් තවදුරටත් උනන්දු විය යුතුයි.

අනෙක් අතට කෘෂිකාර්මික අංශයේ බලධාරීන්, හැම කන්නයකටම ගොවීන්ට ඔවුන්ගේ නිෂ්පාදනවලට හොඳ මිලක් ලැබෙන්නේ නැත. ගොවීන්ට අලාභවී ඇත. ණය ගෙවා ගත නොහැකිවී ඇත. යනාදී දේවල් නොකියා අනාගත වෙළඳපොලට අවශ්‍ය හොඳ වෙළඳපොලක් හා මිලක් ඇති පොල්පලා වැනි වගාවන්ද ව්‍යාප්ත කිරීමට හා දියුණු කිරීම සඳහා ක්‍රමවත් ව්‍යාපෘති වැඩපිළිවෙලක් සැකසිය යුතුය. ඒ තුළින් දැනට පුන පුනා කියන අලෙවි ප්‍රශ්ණයට තවත් විකල්පයක් ලෙස හෝ අභියෝගයක් ලෙස ආර්ථිකමය කෘෂිකාර්මික කටයුත්තක් ලෙස පොල්පලා වගාවද ලංකාවට හඳුන්වා දිය හැකිය.